# විනිවිද

රෝහල්වලට අනුයුක්ත සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අත්දැකීම්

සත්‍ය සිද්ධීන් ඇසුරිනි.
නම්, ගම් පමණක් මනඃකල්පිතයි.

**සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.**

# විනිවිද

© සමාජ සේවා දෙපාර්තමේන්තුව

ISBN 978-955-8189-17-7

පළමු මුද්‍රණය : 2016 දෙසැම්බර්

**අධීක්ෂණය :**

ප්‍රදීප් යසරත්න මහතා - අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය :**

01. එම්. ආර්. ශාන්ත කුමාර මහතා
    සමාජ සේවා නිලධාරී - සමාජ සේවා දෙපාර්තමේන්තුව

02. එච්. එම්. ජයන්ත ප්‍රේමලාල් මහතා
    සමාජ සේවා නිලධාරී - සමාජ සේවා දෙපාර්තමේන්තුව

03. ධම්මික වාසල බණ්ඩාර මහතා
    සමාජ සේවා නිලධාරී - සමාජ සේවා දෙපාර්තමේන්තුව

04. ඒ. කේ. ඩී. ඩී. ලක්ෂාදි මහත්මිය
    සමාජ සංවර්ධන සහකාර - සමාජ සේවා දෙපාර්තමේන්තුව

05. රසිකා නිල්මිණි මහත්මිය
    සංවර්ධන නිලධාරී - සමාජ සේවා දෙපාර්තමේන්තුව

06. තිලකසිරි ගමගේ මහතා
    රාජ්‍ය කළමනාකරණ සහකාර - සමාජ සේවා දෙපාර්තමේන්තුව

**සංස්කාරක**

විමල් පෙරේරා මහතා - සම්මානනීය නාට්‍ය අධ්‍යක්ෂක

**සහය සංස්කාරක හා සෝදුපත් පරීක්ෂක**

සිතු නිර්මිත මහතා - නිර්මාණාත්මක ලේඛක

# සුවිශේෂී වූ සමාජ කර්තව්‍යයක්...

නිරෝගීකම යනු ලොව උතුම් සැපත ලෙස බුදු දහමේ ද විස්තර කරන්නක් සේ ම රෝගී ජීවිතයෙන් අසරණ වූ පුද්ගලයින්ට යම් අස්වැසිල්ලක් වන්නට අපට හැකි නම් එය මහඟු සේවයක් වේ. ජීවත් වන්නට හැකියාවක් නොමැති, කිසිවකුගේ හවිහරණක් නොමැතිව රෝගීව සිටින අසරණ වූවන් සඳහා යම් අයුරකින් හෝ අස්වැසිල්ලක් වන්නට අපට හැකි නම් එය මහඟු පුණ්‍යකර්මයක් ද වේ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් රෝහල්වලට අනුයුක්තව සේවය කරනු ලබන සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාරවරුන්, සංවර්ධන නිලධාරීන් මෙම කර්තව්‍යයේ කොටස්කරුවන් බවට පත් වී කරනු ලබන සේවාව සැබවින් ම අගය කල යුතුයි. ඔවුන් අසරණ රෝගීන්ගේ සුභසාධන අවශ්‍යතාවයන් පමණක් නොව ආර්ථික හා සමාජමය අවශ්‍යතාවයන් සොයා බලමින් ඔවුන් හට පිහිටක් වීම සඳහා ක්‍රියා කරයි. එම සත් ක්‍රියාවේදී ඔවුන් ලබන අත්දැකීම් සුවිශේෂි අත්දැකීම් බවට පත් වේ.

එපමණක් නොව ඔවුන් එම අත්දැකීම් අන් අයත් සමඟ බෙදා හදා ගැනීමට දරණ උත්සාහය මෙම ග්‍රන්ථ්‍ය තුළින් මනාව පෙනී යන්නකි. එය අත්විඳින අන් අය ද අසරණ රෝගීන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගනිමින් ඔවුන්ට සරණක් වීමට පෙළඹෙනු නොඅනුමාන ය. එම නිසා මෙම ග්‍රන්ථය එළිදැක්වීම සුවිශේෂී වූ සමාජ කර්තව්‍යක් ලෙස මම දකිමි.

**එස්. බී. දිසානායක**
සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍ය

# සමාජ සුභසාධන රාජකාරියේ අතුරු ඵලයක් වන තවත් සමාජ සත්කාරයක්...

ශ්‍රී ලාංකීය සමාජයේ අවාසි සහගත තත්ත්වයන්ට මුහුණපාමින් ජීවත් වන ආබාධ සහිත පුද්ගලයින්, රෝගීන්, ආර්ථික වශයෙන් දිළිඳුභාවයට පත් ජන කොටස්, කිසිවෙකුගේ හවිහරණක් නොලබන වැඩිහිටියන්, වැන්දඹු කාන්තාවන් ආදීන් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම මෙන් ම සුභසාධනය වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම ලබාදීම සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ වගකීම වන අතර ඒ සඳහා අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන මගින් මේ වන විට විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය යටතේ පවතින සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සමාජ සේවා නිලධාරීන් විශාල සංඛ්‍යාවක් දිවයින පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට මෙන් ම රෝහල් සහ සුභසාධන ආයතනවලට ද අනුයුක්තව ඉහත කී කාර්යභාරය ඉටුකිරීම සඳහා දැඩි කැපවීමෙන් යුතුව රාජකාරී කරති.

අසරණ බවේ යටි අඩියට ම වැටී කිසිවක් කරකියාගත නොහැකිව යම් සහනයක් අපේක්ෂාවෙන් තමන් වෙත පැමිණෙන්නන් හට අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් හැකි උපරිම ලෙස සේවා සැපයීමට කාරුණික වන අපගේ නිලධාරීන් ඉටුකරන කාර්යභාරය සැබවින් ම අගය කළ යුතුය. එමෙන් ම එම සේවාලාභීන් එකිනෙකට වෙනස් වූ විවිධ කරුණු හේතු කාරක කොට පැන නැගෙන ගැටළු වලින් පීඩා විඳින්නන් වන බැවින් ඔවුන් ඉදිරිපත් කරන තොරතුරු එම නිලධාරීන්ගේ අත්දැකීම් පෝෂණය කිරීමට මෙන් ම සේවා ඵලදායීතාව වර්ධනය කිරීමට ද විශාල දායකත්වයක් සපය යි.

මහජන නියෝජිතයකු ලෙස දිගු කලක් ද, විශේෂයෙන් ම සුභසාධන විෂයභාර නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස වසර 2ක පමණ කාලයක් ද සේවය කිරීමේ දී මා හට ද එවැනි ම අත්දැකීම් සම්භාරයක් ලබාගැනීමට හැකිවිය. මහජන සේවයේ දී ලබන අත්දැකීම් පුරවැසියන්ගේ දැනගැනීම පිණිස සමාජගත කිරීම, විශේෂයෙන් ම කණිෂ්ඨ නිලධාරීන්ට මෙන් ම මුළු මහත් සමාජයේ සෑම තරාතිරමක ම පුද්ගලයන්ට සමාජය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීමට ඉවහල් වන වැදගත් කාර්යයකි.

අපගේ නිලධාරීන් තම සේවයෙහි අතුරු ඵලයක් ලෙස සේවය තුළින් ලබන අත්දැකීම් අසුරින් ග්‍රන්ථයක් නිර්මාණය කොට එළි දැක්වීමට උත්සහ දැරීම රාජ්‍ය සේවයේ සාම්ප්‍රදායික සීමාවන් අතික්‍රමණය කරමින් සිදු කරනු ලබන තවත් වටිනා සමාජ සත්කාරයක් වනු ඇත. එය අනාගත පරපුර අසරණයන්ගේ ගැටළු සම්බන්ධයෙන් දරණ ආකල්පයන් ධනාත්මකව සංවර්ධනය කිරීමටත්, හුදු සමාජ ප්‍රගමනයටත් හේතු වන බව මාගේ විශ්වාසය යි.

**රන්ජන් රාමනායක**

සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍ය

# සමාජ යථාර්ථයේ කැඩපතක්...

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත, 2003 ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, 2006 ඔක්තෝම්බර් මස 17 වන දින නිකුත් කරන ලද ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ පහසුකම් පිළිබඳ අති විශේෂ ගැසට් පත්‍රය ආදී අණ පනත් සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ ප්‍රමුඛ අරමුණ වන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී සුවිශේෂී වේ.

එම අරමුණ පෙරදැරි කරගෙන සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය හා සමාජ සේවා දෙපාර්තමේන්තුව එක්ව ආබාධ සහිත ප්‍රජාව සඳහා විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අතරින් දිවයිනේ විවිධ දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි රෝහල් සඳහා අනුයුක්තව සිටින සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාර වරුන් හා සංවර්ධන නිලධාරීන් විසින් රෝහල්ගතව සිටින අසරණ රෝගීන්ගේ සුභසාධන හා සමාජ අවශ්‍යතාවයන් ඉටු කරනු ලබයි.

එහිදී ඔවුන් රෝගීන්ගේ සමාජ, සංස්කෘතික හා ආර්ථික පරිසරය අලලා ලබන අත්දැකීම් තම ජීවිත අත්දැකීමක් කරගනිමින් ඒවා නිර්මාණාත්මක එකතුවක් ලෙස සමාජගත කිරීම සඳහා වන මෙම ග්‍රන්ථය සමාජ යථාර්ථයේ කැඩපතක් ලෙස ද මම දකිමි.

**මහින්ද සෙනෙවිරත්න**
ලේකම්
සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය

# අත්දැකීම් තුළින් ලද ජයග්‍රහණයක්...

සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය හා සමාජ සේවා දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලබන සියලුම සමාජ සුභසාධන සේවාවන්, දීප ව්‍යාප්ත සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ම අනුයුක්තව සිටින සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබයි. එසේ ම, ජාතික රෝහල ද ඇතුළුව දිවයින පුරා දිස්ත්‍රික් රෝහල්වලට අනුයුක්තව සිටින අප නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියුක්ත නිලධාරීන් සේම, ඉටු කරනු ලබන සේවාවන් සැබවින් ම පැසසිය යුතු ය.

විශේෂයෙන් ම රෝහල්ගතව සිටින රෝගීන්ගේ සුභසාධන අවශ්‍යතාවයන් සොයා බලමින් ඒවා ඉටු කිරීම සඳහා ඔවුන් දක්වන උත්සාහය තුළින් ලබන අත්දැකීම් වෙනත් සේවාවන් හා සැසඳීමේ දී බොහෝ සංවේදී අත්දැකීම් බවට පත් වේ. ඔවුන් ස්වකීය අත්දැකීම් ඔවුන්ගේ අත්දැකීමක් පමණක් කර නොගනිමින් ඒවා අන් අය වෙත ද දායාද කිරීමට ගන්නා වෑයම ඔවුන්ගේ මෙම ග්‍රන්ථය තුළින් මැනවින් පැහැදිලි වේ.

අසරණ රෝගීන්, ආබාධිත වූවන් මෙන් ම වැන්දඹු කාන්තාවන්, වැඩිහිටි පුද්ගලයින් වැනි සමාජයේ අවාසි සහගත වූවන් කිසිවකුගේ පිහිටක් නොමැතිව අසරණ තත්ත්වයන් ට මුහුණපාන ආකාරය මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීමේදී මනාව පැහැදිලි වෙයි. අප නිලධාරීන් ඔවුන්ගේ අත්දැකීම් සමාජගත කිරීම සඳහා මෙම ග්‍රන්ථය නිර්මාණය කිරීම සැබවින් ම ඔවුන් ලද ජයග්‍රහණයකි.

**ප්‍රදීප් යසරත්න**

සමාජ සේවා අධ්‍යක්ෂ

# පටුන


| | | |
|---|---|---|
| 1. | $O_2$ | 01 |
| 2. | අසරණයෝ | 04 |
| 3. | තොණ්ඩුව | 06 |
| 4. | පියානෝ | 11 |
| 5. | මරණ මංචකයේ දී ලියූ ආදර කවිය | 15 |
| 6. | මල් කැකුලක ඉකි බිඳුම | 19 |
| 7. | ඈ නොදුටු සෙල්ෆිය | 22 |
| 8. | රළ පහර | 26 |
| 9. | කුසුමාවතියක් වූ තංගම්මා | 30 |
| 10. | වී. කේ. සර් | 33 |
| 11. | මාලනීට සවියක් | 37 |
| 12. | සුවපත් හිතක් | 40 |
| 13. | වියෝගය | 43 |
| 14. | කිරිඅම්මා ගේ මිණිබිරිය | 45 |
| 15. | රැකවරණය | 48 |
| 16. | ඇන්දවීම හා ඇඳගැනීම | 52 |
| 17. | සරුංගලය | 55 |
| 18. | වකුගඩුව | 59 |
| 19. | පමා වූ අක්ෂරය | 62 |
| 20. | රස්තියාදුකාරයා | 66 |
| 21. | සුළි කුණාටු | 69 |
| 22. | අලුත් ජීවිත | 72 |
| 23. | බ්‍රේන් ඩෙත් ෂර්මිලා | 75 |
| 24. | සිහින | 78 |
| 25. | සාලය මැද අඩි පාර | 81 |
| 26. | එක වහළක් යට | 85 |
| 27. | හුදකලා වූ දරුවෝ | 88 |
| 28. | අභියෝගයන්ට සරදම් කළ මෙහෙකාරිය | 91 |
| 29. | මවක් සහ දුවක් | 95 |
| 30. | අහිමි සෙනෙහස | 100 |
| 31. | අලුත් ගෙදර | 105 |
| 32. | පිය සෙනෙහස | 108 |
| 33. | කුරුල්ලෝ | 111 |
| 34. | ආදරණීය බිරිඳ | 114 |
| 35. | රෝහල්ගත වීමේ චක්‍රය | 117 |
| 36. | ජීවිත සැඳෑව | 119 |
| 37. | හිතුවක්කාරකම | 122 |
| 38. | කඳුකරේ සෝ ගීය | 125 |
| 39. | රෝහලක තාරුණ්‍යය | 128 |
| 40. | මෙහෙයුම | 132 |